# සරණංකර සංඝරාජ සඟ පරපුර සහ පහතරට බෞද්ධ අධ්‍යාපනික ප්‍රබෝධය

## The Lineage of Saranankara sangaraja and Buddhist Educational Flourish in South.

වටරක්ගොඩ සුමන හිමි

---

**Abstract**

The 18th century movement led by Ven. Weliwita Saranakara and his effort to reform the education system are discussed in this paper. The monastic life in Sri Lanka was facing a downfall due to the disregard of monastic discipline and the absence of institutional education when Ven. Saranankara obtained his monkhood. Therefore, he had to make every possible effort to restore the monastic life and its education. First, he created an assembly called Silvath Samagama (a group of real monks), and developed a system of education with the support of various teachers, overcoming numerous obstacles. Through this procedure, he was able to establish a new society monk of rich in knowledge and disciplines. Among the members of this society, Ven. Sitinamaluwe Dhammajothi (who first brought this dawn to the South), Ven. Karathota Dhammarama, and Ven Watarakgoda Dhammapala played a vital role in bridging this educational and religious renaissance to the South Division of the country. Their guidance paved the way for the emergence of scholars such as Ven. Wehelle Dhammadinna, Ven. Kadurupokune Swannajothi, Ven. Dickwelle Buddharakkhita, Paththayame Lekam and Baranaganitacharya. These scholars lead the way to the advancement of new sects. Ven. Wehelle Dhammadinna expand this lineage as the Wehalle sect, which gave rise to two sub-divisions; the Wewa Sanga division and

Ransegoda division. Scholars from these sects spearheaded the revival of religion and education throughout the country. The Mulkirigala sect, founded by Ven. Watarakgoda Dhammapala, was a significant faction that aided in the progress of education in Southern Sri Lanka. During the British colonial period, this sect engaged with the public and made a massive contribution for their benefit.

**Keywords:-** Education revival, Kandyan Era, Ven.Saranakara, Silvath Samagama

**සාරසංක්ෂේපය**

දහ අටවන සියවසේ මහනුවර රාජධානිය පදනම් කරගනිමින් වර්ධනය වූ වැලිවිට සරණංකර හිමියන්ගේ කාර්යභාරයත් උන්වහන්සේගේ සම්ප්‍රදාය විසින් සිදුකරන ලද අධ්‍යාපනික මෙහෙවරත් මෙහිදී සාකච්ඡාවට බඳුන්කොට තිබේ. සරණංකර හිමියන් පැවිදිවන සමයේ ලංකාවේ භික්ෂු ශාසනය පැවතියේ ඉතා දුර්වල තත්ත්වයකය. ශාසනික පිළිවෙත් මෙන්ම භික්ෂු අධ්‍යාපනය ද බෙහෙවින් පරිහානියට පත්ව තිබූ බැවින් භික්ෂුත්වයට අදාළ කාරණාවන් ප්‍රගුණ කිරීමට සරණංකර හිමියන්ට විශාල පරිශ්‍රමයක් දරන්නට සිදුවිය. එම පරිශ්‍රමයේ ප්‍රතිඵලයක් වශයෙන් සිල්වත් සමාගම නමින් නව භික්ෂු කණ්ඩායමක් නිර්මාණය කරන්නට උන්වහන්සේ සමත් වූහ. ඒ අතරතුර විවිධ ගුරුවරුන් සොයා යමින් ඉතා දුෂ්කර තත්ත්වයන් යටතේ අධ්‍යාපනය ලබාගැනීමේ කාර්යය ද ඉතා සාර්ථකව සිදුකිරීමට සරණංකර හිමි සමත් විය. මෙම ක්‍රියාවලි ද්විත්වය තුළින් ප්‍රතිපත්තියෙන් හා අධ්‍යාපනික ඥානයෙන් යුත් භික්ෂු පිරිසක් නිර්මාණය විය. මෙසේ නිර්මාණය වූ භික්ෂූන් අතරින් පහත රට සිට පැමිණි සිටිනාමළුවේ ධම්මජෝති, වෙහැල්ලේ ධම්මදින්න, කරතොට ධම්මාරාම සහ වටරක්ගොඩ ධම්මපාල යන හිමිවරුන් සුවිශේෂි වෙයි. කන්ද උඩරටින් උද්දීපනය වූ ආගමික සහ අධ්‍යාපනික ප්‍රබෝධය පහත රට කලාපයට පළමුවෙන්ම රැගෙන ගියේ සිටිනාමළුවේ හිමියන්ය. උන්වහන්සේගෙන් ඉටු වූ වැදගත්ම සේවය වන්නේ වෙහැල්ලේ ධම්මදින්න, කදුරුපොකුණේ සුවණ්ණජෝති, දික්වැල්ලේ බුද්ධරක්ඛිත යන භික්ෂූන් වහන්සේලා සහ පත්තායමේ ලේකම්, බරණගණිතාචාර්ය යනාදී ශිෂ්‍ය ප්‍රජාවක්

බිහි කිරීමයි. මෙම ශිෂ්‍යයන්ගෙන් වේහැල්ලේ ධම්මදින්න හිමියන්ගේ මූලිකත්වයෙන් වේහැල්ල සඟ පරපුර නිර්මාණය වන අතර පහත රට පුරා ආගමික සහ අධ්‍යාපනික පුනර්ජීවනයක් ඇති කිරීමට එමගින් හැකි විය. වේහැල්ල පරපුරේම අනුශාඛා වශයෙන් වැව සඟ පරපුර සහ රන්සෑගොඩ පරපුර හඳුනාගත හැකිය. පහතරට අධ්‍යාපනික සංවර්ධනයේ දී මූලිකත්වය ගත් අනෙක් සඟ පරපුර වන්නේ මුල්ගිරිගල සඟ පරපුරයි. වටරක්ගොඩ ධම්මපාල හිමියන්ගේ මූලිකත්වයෙන් ආරම්භවන මෙම පරම්පරාව යටත්විජිත පාලන සමයේ දේශිය ජනී ජනයා වෙනුවෙන් පෙනී සිටිමින් සුවිසල් මෙහෙවරක නිරතව තිබේ.

යතුරු පදඃ- අධ්‍යාපනික ප්‍රබෝධය, සරණංකර හිමි, නුවර යුගය, සිල්වත් සමාගම

## හැඳින්වීම

වැලිවිට සරණංකර හිමියන් මහනුවර කේන්ද්‍රකරගනිමින් දහඅටවන සියවසේ ආරම්භ කරන ලද ශාසනික සහ අධ්‍යාපනික ප්‍රබෝධය ශීඝ්‍රයෙන් පැතිර ගියේ දකුණු පළාත පදනම් කරගනිමිනි. එය වේහැල්ල, මුල්කිරිගල, රන්සෑගොඩ සහ වැව යන සංඝ පරම්පරා බිහිවීම මගින් දීප්තිමත් විය. එම සංඝ පරම්පරා බිහිකරමින් පහතරට අධ්‍යාපනික තත්ත්වය නගාසිටුවීමට සිටිනාමළුවේ ධම්මජෝති, වේහැල්ලේ ධම්මදින්න, වටරක්ගොඩ ධම්මපාල, රන්සෑගොඩ ධම්මදස්සි, වැව ඉන්දසර, බෝවල ධම්මානන්ද, ගාල්ලේ මේධංකර සහ වලානේ සිද්ධත්ථ යනාදී හිමිවරු සුවිශේෂී දායකත්වයක් සැපයූහ. මෙම භික්ෂු නායකත්වයන් යටතේ මුල්කිරිගල, සංඛපාල, මාතර වේරගම්පිට, කිතුලේවෙල, හිත්තැටිය, කසාගල, පල්ලත්තර, බෙන්තර, පැල්මඩුල්ල, රත්මලාන ආදි ප්‍රදේශයන්හි විහාරස්ථාන සේම අධ්‍යාපනික මධ්‍යස්ථාන ද වර්ධනය වන්නට විය. යටත් විජිත සමයේ මෙකී වර්ධනය වීම් නව මානයකට ලංකා සමාජ දේහය රැගෙන යාමට ප්‍රයත්න දරනා ආකාරය හඳුනාගත හැකිය.

සංඝරාජ සඟ පරපුරත් ඔවුන් ලංකා සිතියමේ පහත රට කලාපයට අධ්‍යාපනික වශයෙන් සිදුකරන ලද බලපෑමත් පිළිබඳව අධ්‍යයනය කරන මෙම පර්යේෂණයේ දී පර්යේෂණ ගැටලුව ලෙස

දහඅට සහ දහනව වන සියවස්වල පහතරට අධ්‍යාපනික ප්‍රබෝධයට භික්ෂු ක්‍රියාකාරකම් බලපෑවේ කෙසේද? යන්න තෝරාගෙන එකී ගැටලුව නිරාකරණය සඳහා පර්යේෂණ ක්‍රමවේද වශයෙන් ඓතිහාසික පර්යේෂණ ක්‍රමවේදයත් උක්ත විහාරස්ථානයන්හි ක්ෂේත්‍ර අධ්‍යයනයක නිරත වීමත් යන ක්‍රමවේදයන් උපයෝගී කරගැනීමට බලාපොරොත්තු වේ.

## සංඝරාජ සඟ පරපුර සහ පහතරට අධ්‍යාපනික ප්‍රබෝධය

1698 ජූනි මස දහනව වන දින උඩරට තුම්පනේ වැලිවිටදී සරණංකර සංඝරාජ හිමියන් උපත ලබයි (ප්‍රඥාතිස්ස හිමි, (සංස්.) 1948: 31-32).* සොළොස් අවුරුදු වියේදී සූරියගොඩ මහා ස්ථවිර සාමීන් ළඟ පැවිදි වී ඇත (පියනන්ද හිමි, (සංස්.) 1969: 14). වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ රජුගේ ගුරුවරයා ලෙසද කටයුතු කොට ඇති සූරියගොඩ තෙරුන් රාජ උදහසට ලක්වීමෙන් මරණයට පත් කළ බව සරණංකර හිමියන් ලියූ ලිපියක සඳහන්ව ඇත (ජයතිලක, 1955: 158). ගුරුවරයාද අහිමි වූ සරණංකර හිමියන් දැඩි අධිෂ්ඨානශීලිත්වයකින් යුක්තව අධ්‍යාපනික කටයුතු සිදුකරගෙන ගොස් තිබේ. ඉගෙනගැනීමට ගුරුවරුන් සොයාගැනීම අතිදුෂ්කර වූ එම සමයේ සිරගතව සිටි ලෙව්කේ රාළ නමැත්තෙකුගෙන් පාලි භාෂාවට අදාළ මූලික ව්‍යාකරණත් පල්කුඹුරේ අත්ථදස්සි නම් හිමියන්ගෙන් ඒ පිළිබඳ තවදුරටත් දැනුම ලබා ගත් ස්වයං අධ්‍යයනයක නිරත වූ සරණංකර හිමියන් ප්‍රාචීන භාෂා පිළිබඳ ප්‍රවීණයෙක් බවට පත් විය (පියනන්ද හිමි, (සංස්.) 1969: 14-15).

මෙම සමයේ රටේ පැවති අස්ථාවර දේශපාලන තත්ත්වයත් බෞද්ධාගම සඳහා රාජ්‍ය අනුග්‍රහය නොලැබීමත් යන කාරණා

* සකවසිනෙක් දහස්
සසිය විස්සක් පිරිවස්
සැටසක රිවි දවස්
උතුරු පුටුපේ අවපොසොන් වස්

තුන්පොනේ වැලිවිට
ගොවිකුල මුදලිකෙනෙකුට
දාව පිරිසිදු කොට
ඉපිද වැඩෙමින් කෙළන වයසට

ප්‍රධාන කරගනිමින් ප්‍රතිපත්තිමය වශයෙන් දැඩි පරිහානියකට ලක්ව තිබූ ශාසනය නඟා සිටුවීම සඳහා සරණංකර හිමියන් විසින් තමන් ළග පැවිදි වූ ශිෂ්‍ය ප්‍රජාව, භික්ෂුවට අදාළ නියම පිළවෙත් පුරන පිරිසක් ලෙස සංවිධානගත කරමින් සිල්වත් සමාගම නමින් ජනතාව විසින් නාමකරණය කරන ලද සංස්ථාවකට නායකත්වය ලබා දෙන ලදී (පියනන්ද හිමි, (සංස්.) 1969: 18). එසේම ස්වකීය පාණ්ඩිත්‍ය මගින් නරේන්ද්‍රසිංහ රජතුමාද පහදවාගත් සරණංකර හිමියන් තමන් විසින් බුද්ධාගමේ ප්‍රබෝධය සඳහා දියත් කරන ලද වැඩ සටහන් සඳහා රාජ්‍ය අනුග්‍රහය ලබාගැනීමට සමත් විය. ඒ අනුව උඩුනුවර ඇම්බැක්ක දේවාලයට ආසන්නයේ නියමකන්ද නමින් අධ්‍යාපනික මධ්‍යස්ථානයක් නිර්මාණය කෙරුණි (පියනන්ද හිමි, (සංස්.) 1969: 23-24). සංඝරාජ සාධු චරියාව දක්වන ආකාරයට නරේන්ද්‍රසිංහ රජුගේ කාලයේදීම මෙම අධ්‍යාපන මධ්‍යස්ථානය කේන්ද්‍ර කර ගනිමින් ගිහිපැවිදි දෙපාර්ශ්වයේම හත්සියයක් පමණ පිරිස වර්ධනය වී තිබේ (පියනන්ද හිමි, (සංස්.) 1969: 26). මේ ආකාරයට වර්ධනය වන ශිෂ්‍ය ප්‍රජාවට අධ්‍යාපනය ලබා දීමට නව අධ්‍යාපනික මධ්‍යස්ථාන බිහිකිරීමට සරණංකර හිමියන් කටයුතු කොට තිබේ. මල්වතු විහාරය හෙවත් පෝයමලු විහාරයේ හා අස්ගිරි විහාරයේ නව අධ්‍යාපන මධ්‍යස්ථාන නිර්මාණය කෙරුණි (වාචිස්සර හිමි, 1960: 36). සරණංකර හිමියන්ගේ කැපවීම මත මහනුවර සහ තදාසන්න කලාපයේ අධ්‍යාපනික ප්‍රබෝධයක් ශීඝ්‍රයෙන් වර්ධනය විය. නරේන්ද්‍රසිංහ රජු විසින් මීළග රාජ්‍ය අනුප්‍රාප්තිකයා ලෙස තෝරාගෙන සිටි ස්වකීය දකුණු ඉන්දීය බිසවගේ සොහොයුරා වූ විජය රාජසිංහට අධ්‍යාපනය ලබා දීමේ වගකීම පවරන්නේද සරණංකර හිමියන්ටය (ලංකානන්ද හිමි, (සංස්.) 1996: 67-68). ලංකාවේ කන්ද උඩරට නායක්කර් රාජ වංශය මොහුගෙන් ආරම්භ වන අතර එම පත්වීමට රදළ පිරිස් විරෝධතාව දැක්වුවද ඒවා සමනය කිරීමට සරණංකර හිමියන් සමත්වන ආකාරය හඳුනාගත හැකිය. රාජගුරු තනතුරෙන් පිදුම් ලබමින් (ලංකානන්ද හිමි, (සංස්.) 1996: 71) රජුන් නිර්මාණය කරන තත්ත්වයට සරණංකර හිමියන් පත්ව සිටීමෙන් පෙනෙන්නේ උන්වහන්සේ ප්‍රතිපත්තිමය පැවැත්මෙන් හා අධ්‍යාපනික සේවය මගින් තත්කාලීන සමාජයට බලපෑම් කළ හැකි ප්‍රබල චරිතයක් බවට පත්ව සිටි බවයි. මින් පසුව කීර්ති ශ්‍රී රාජ සිංහ රජුගේ අනුග්‍රය යටතේ සුදුහුම්පොළ, අම්පිටිය, නිත්තවෙල හා ගංගාරාමය යන විහාරස්ථානයන්හිද විද්‍යාස්ථාන

ආරම්භ කොට සියලු ජනයාට අධ්‍යාපනය ලබාදීමට කටයුතු කොට තිබේ (ලංකානන්ද හිමි, (සංස්.) 1996: 85).*

සරණංකර හිමියන් විසින් ආරම්භ කරන ලද විද්‍යාස්ථාන ඇසුරු කරගනිමින් බිහි වූ ශිෂ්‍ය පිරිසද තත්කාලීන ලංකාවේ බිඳ වැටී තිබූ බුද්ධ ශාසනය සහ අධ්‍යාපනික තත්ත්වය නඟා සිටු වීම සඳහා විශාල මෙහෙයක් සිදු කොට ඇත. සරණංකර හිමියන්ගේ ආගමික හා අධ්‍යාපනික කටයුතු ව්‍යාප්ත කිරීම ආරම්භ කළ සමයේ සිටම උන්වහන්සේ සමීපයේ සිටි භික්ෂූන් ලෙස සිටිනාමළුවේ, ඉලිපැන්ගමුවේ, හුලංගමුවේ, කදිරාගොඩ, වටබුළුවේ සහ ඊසිපිටියේ යන භික්ෂූන් වහන්සේලා හඳුනාගත හැකිය (පියනන්ද හිමි, (සංස්.) 1969: 11,17,33). මෙම භික්ෂූන් වහන්සේලා සරණංකර හිමියන්ගේ සහයෝගය ලබාගනිමින් ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශයන්හි අධ්‍යාපනික සහ ආගමික කටයුතු ප්‍රබෝධමත් කිරීමට උර දී කටයුතු කරන්නට වූහ. ඒ අතරතුර සඝ පරපුරු නිර්මාණය කරගනිමින් ලංකාව පුරා ව්‍යාප්ත කිරීමේදී උඩරට සහ පහතරට ශිෂ්‍ය පරම්පරා වශයෙන් ප්‍රධාන කොටස් දෙකකට බෙදී ව්‍යාප්ත වී ගියේය.

දහනවවන සියවසේ ශ්‍රී ලංකාවේ ඇතිවන බෞද්ධ අධ්‍යාපනික ප්‍රබෝධයට අවශ්‍ය වන පසුතලය සකසන්නේ පහතරට කේන්ද්‍ර කර ගනිමින් පැතිරෙන සංඝරාජ හිමියන්ගේ ශිෂ්‍ය පරම්පරාව විසිනි. එහිදී ප්‍රමුඛස්ථානය ගන්නේ සිටිනාමළුවේ ධම්මජෝති හිමියන්ගේ නායකත්වයෙන් ආරම්භ වන වෙහැල්ල සඝ පරපුරයි. නූතන හම්බන්තොට දිස්ත්‍රික්කයේ බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් සිටිනාමළුව නම් ගමේ උපත ලැබූ මුන්වහන්සේ තිස්සමහාරාමයේ සිටි කඳුරුපොකුණේ නවරත්න නම් ගණින්නාන්සේගේ ශිෂ්‍යයෙක් වශයෙන් පැවිදි වී තිබේ (වනරතන හිමි, 1950: 15). පහතරට ප්‍රදේශයේ ශාසනය පිරිහී පැවති බැවින් ධර්මය ඉගෙන ගැනීමට පහසුකම් නොවූයෙන් ඒ වන විට වැලිවිට සරණංකර හිමියන් උඩරට සිට අධ්‍යාපනය ලබා ගනිමින් ශාසනය වර්ධනය

* සුදුහුම්පොල ද අම්පිටිය ද නිත්ත වෙල
ගංගාරාම වෙහෙර ද නුවර සිව් පල
ගම්වර දෙවා සිප්සැල් වැවස්තා නිල
පත්කර ඉගනීම අත්කළ දන සියල

කිරීමේ කටයුත්තෙහි නිරත වන බව ආරංචි කරගත් ධම්මජෝති හිමියන් සරණංකර හිමියන් සමග එකතුව තිබේ. සරණංකර හිමියන් පාලි භාෂාව ඉගෙනගැනීම සඳහා වෙහෙස මහන්සි වූ මුල් යුගයේ සිටම ධම්මජෝති හිමියන් උන්වහන්සේට සහය දෙමින් කටයුතු කළ භික්ෂුවක් බව තත්කාලීන කෘති තහවුරු කරයි(පියනන්ද හිමි, (සංස්.) 1969: 23). එසේම ධම්මජෝති හිමියන්, සරණංකර හිමියන් සමීපයේ වාසය කරමින් ධර්ම විනය ඉගෙනගනිමින් ශිෂ්‍යයන්ටද ඒවා ප්‍රගුණ කරවමින් ඉතා උද්‍යෝගයෙන් යුක්තව කටයුතු කොට ඇති ආකාරය සංඝරාජ සාධුචරියාවෙන් මනාව පැහැදිලි වේ (පියනන්ද හිමි, (සංස්.) 1969: 35-36). සරණංකර හිමියන්ගේ නායකත්වය යටතේ සියම් රටෙන් උපසම්පදාව රැගෙන ඒමෙන් අනතුරුව උපසම්පදාව ලබාගෙන තිබේ. ඉන් පසුව මාතර ප්‍රදේශයට වැඩම කළ මුන්වහන්සේ කහදූවේ මුදියන්සේ නමැත්තෙකු විසින් සාදා දුන් විහාරයේ වාසය කරමින් අධ්‍යාපනික සේවයේ නිරත වූහ (පඤ්ඤාලෝක හිමි, 2002: 345). පාලි භාෂා අධ්‍යයනය නඟා සිටුවීම සඳහා බාලාවතාරය නම් පාලි ව්‍යාකරණ ග්‍රන්ථයට අර්ථ ව්‍යාඛ්‍යාන දක්වමින් මෙම හිමියන් රචනා කළ බාලවතාර සංග්‍රහ නම් කෘතිය තත් සමයේ ශිෂ්‍යයන් අතර පාලි භාෂාව ජනප්‍රිය කරවීමට ඉවහල්ව තිබේ (වීරසූරිය, 1951: 22). ඊට අමතරව මෙම හිමියන්ගෙන් සිදු වූ වැදගත්ම සේවය වූයේ වටිනා ශිෂ්‍ය ප්‍රජාවක් නිර්මාණය කිරීමයි. වෙහැල්ලේ ධම්මදින්න, කදුරුපොකුණේ සුවණ්ණජෝති, දික්වැල්ලේ බුද්ධරක්ඛිත යන භික්ෂූන් වහන්සේලා සහ පත්තායමේ ලේකම් සහ බරණගණිතාචාර්ය යනාදීහු සිටිනාමලුවේ හිමියන්ගේ ශිෂ්‍යයන් ලෙස හඳුනාගත හැකිය (හේවාවසම්, 1966: 43).

උක්ත ශිෂ්‍යයන් අතුරින් පහතරට අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රගමනය සඳහා විශාල සේවයක් ඉටුකරන ලද්දේ වෙහැල්ලේ ධම්මදින්න හිමියන් විසිනි. ධම්මදින්න හිමියන් සිටිනාමලුවේ හිමියන්ගේ ශිෂ්‍යයෙකු වශයෙන් සැලකුවත් උන්වහන්සේත් තිස්සමහාරාමයේ සිටි නවරත්න ගණින්නාන්සේගේම ශිෂ්‍යයෙකු බවත් දෙදෙනා සද්ධිවිහාරිකයන් බවත් කිරිඇල්ලේ ඤාණවිමල හිමියෝ පෙන්වා දෙති (ඤාණවිමල හිමි, 1975: හැඳින්වීම). කෙසේ නමුත් සිටිනාමලුවේ හිමියන් ගත් මගම යමින් වෙහැල්ලේ හිමියන්ද 1728දී මහනුවර සරණංකර හිමියන් වෙත ගොස් තිබේ (ඤාණවිමල හිමි, 1975: හැඳින්වීම). ඉතා දක්ෂ ශිෂ්‍යයෙකු

ලෙස අධ්‍යාපනය හදාළ වේහැල්ලේ හිමියන් තත්කාලීන රජුන්ගේ ප්‍රසාදය දිනාගැන්මටද සමර්ථව සිටි බව උන්වහන්සේට ලැබුණු වරප්‍රසාදයන්ගෙන් මැනවින් තහවුරු වේ. කතරගම තඹ සන්නසේ දැක්වෙන ආකාරයට විනාශ වී යමින් තිබූ කතරගම විහාරය දියුණු කිරීම සම්බන්ධයෙන් සතුටට පත් වූ වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජතුමා එම විහාරයේ අධිපතිත්වය වේහැල්ලේ හිමියන්ට පවරාදී තිබේ (ඤාණවිමල හිමි, 1975: 40).* එසේම වේහැල්ලේ තඹ සන්නසින් සරණංකර හිමියන්ගේ අනුදැනුම මත ශ්‍රී පාදස්ථානය, සපරගමු දිශාවේ නවදුන් කෝරළයට ඇතුළත් කුට්ටාපිටිය ගම සහ එකසිය හැටපස් අමුණක භූමිය වේහැල්ලේ හිමියන්ට පවරා දී තිබේ (ඤාණවිමල හිමි, 1975: 37).** මෙම පවරා දීම් සිදු කරන්නේ 1751දීය. ඉන් අනතුරුව රත්නපුර කරන්නාගොඩ පොත්ගුල් විහාරයට ගොස් සබරගමු ප්‍රදේශයේ සහ මාතර ප්‍රදේශයේ විශාල ශාසනික ප්‍රබෝධයක් ඇති කිරීමට කටයුතු කළේය. ඉන් අනතුරුව කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ දායකත්වයෙන් හා වැලිවිට සරණංකර හිමියන්ගේ නායකත්වයෙන් සියම් දේශයේ සිට වැඩම කළ උපාලි හිමියන් විසින් 1753 ඇසළ මස පුර පසළොස්වකදා පැවැත් වූ උපසම්පදා උත්සවයේදී සබරගමු හා පහතරට ප්‍රදේශය නියෝජය කළ හතළිස් දෙකක් වූ ගණින්නාන්සේලා සමග වේහැල්ලේ ධම්මදින්න හිමියෝ උපසම්පදාව ලබා ගත්හ. මේ පිළිබඳව අතිශයින් ප්‍රසාදයට පත් වූ වැලිවිට සරණංකර හිමියන් රජු සමග සාකච්ඡා කොට වේහැල්ලේ හිමියන්ට දකුණු-සබරගමු දෙදිසාව ඇතුළු පහතරට නායක පදවිය ලබා දුන්නේය (ඤාණවිමල හිමි, 1975: 38).

* "උතුම් පණිවිඩ පනත නම් සකවර්ෂ එක්වාදහස් සසිය පනහට පැමිණි මෙම වර්ෂයෙහි වෙසක් අවතෙලෙස්වක ගෙවී තුදුස්වක ලත් මෙදවස වේහැල්ලේ ගනවොලින් මහ වාසලට පක්ෂ පිරනමානකම් ඇතිව හොඳ හිතින් රැහුනු මහ කතරගම විහාර පදවිය වනගතව නටබුන්ව තිබුනා දිවුනු කෙරෙමින් දුක් ගැන සිටිනා නිසා මෙම විහාර ගමට අඩුත්තු ගොඩ මඩ විල් ඇතුළුව බුත්ති විඳිනා රගට දෙවා වදාල පණතත් මෙසේම පනිඋඩ පනතයි"

** ශ්‍රී උතුම් වූ පනිවුඩ පත නම් වේහැල්ලේ ධම්මදින්න ගණවොලින් මහවාසලට හොඳ හිතින් පක්ෂ පිරමානකම් ඇතුව දුක් ගැණ සිටින නිසා සපරගමුව දිශාව බද සමනලගල විහාර පදවිය සහ මෙම විහාර පදවියට අඩුත්තු ගොඩ මඩ වල් විල් ඉම් ගම් ඇතුළුව භුක්ති විඳිනා පනතටත් දිසාවෙන් දෙවොලෙන් පැමිණි කෙනෙකුන්ගෙන් අවුලයක් උදාරණයක් නැති වගට ශ්‍රී බුද්ධ වර්ෂයෙන් දෙදහස් දෙසීය අනූ හතරක් වූ වෙසඟ පුර පසළොස්වක් ලත් කිවි දින මෙ දවසැ දෙවා වදා පනතත් මෙසෙම පණිවිඩ පනතයි.

උන්වහන්සේද ස්වකීය නායක තනතුරට ගැළපෙන ආකාරයට කටයුතු කරමින් පහතරට ප්‍රදේශය පුරා බුද්ධිමය ප්‍රබෝධයක් ඇතිකරවීම සඳහා කටයුතු කොට තිබේ. ඒ යටතේ වේහැල්ලේ හිමියන් විසින් කතරගම කිරිවෙහෙර, තංගළු වෙහෙර, තිස්සමහාරාමය, කන්දකැටිය විහාරය, කසාගල් විහාරය, තංගල්ලේ වනවාස විහාරය, කොටවායේ විහාරය, කහඳාගල විහාරය, ගලගම උණන පුරාණ විහාරය, ශ්‍රී පාදස්ථානය, පොත්ගුල් රජ මහා විහාරය, පැල්මඬුල්ලෙ කොටවෙහෙර ගාවා පුරාණ විහාරය, ගල්පොත්තාවෙල කුට්ටාපිටියේ පුරාණ විහාරය සහ පළාබත්ගල පුරාණ විහාරය යන විහාරස්ථානයන් සංවර්ධනයට ලක් කරන ලදි. එසේම මෙම විහාරස්ථායන්හි කටයුතු ඉදිරියට පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය කෙරෙන වියත් ශිෂ්‍ය පිරිසක් නිර්මාණය කිරීම ද වේහැල්ලේ හිමියෝ සමත් වූහ. එම ශිෂ්‍යයන්ගෙන් කදුරුපොකුණේ සුවණ්ණජෝති, කිරිනැලියේ රතනජෝති, පල්ලත්තර පුඤ්ඤසාර, කඹුරුපිටියේ සඟිධර ගුණරතන, මාලිම්බඩ ධම්මරතන, දෙහිගස්පේ අත්ථදස්සි, රන්සෑගොඩ ධම්මදස්සි, අගලකඩ ධම්මරක්ඛිත, කොන්ගස්තැන්නේ ධම්මපාල, වැව ඉන්දසර සහ කැටගොඩ රතනජෝති (ඤාණවිමල හිමි, 1975: 59) යනාදි ශිෂ්‍යයන් පහතරට ආගමික සහ අධ්‍යාපනික ක්ෂේත්‍රයේ වර්ධනය සඳහා ලබාදෙන ලද දායකත්වයේ ප්‍රමාණය ඉදිරියේදී සාකච්ඡා කෙරෙන කරුණුවලින් මනාව තහවුරු වනු ඇත.

වේහැල්ලේ ධම්මදින්න හිමියන් තත්කාලීන අධ්‍යාපනික ක්ෂේත්‍රයේ ප්‍රගමනය සඳහා පොත් පත් රචනා කිරීමෙහිද නියැලුණහ. උන්වහන්සේ විසින්ම ලියන ලද තල්පතක දැක්වෙන්නේ "....සරණංකරාභිධාන සංඝරාජ ධුරන්දර ප්‍රාප්ත මහා ස්වාමිපාදයන් වහන්සේගේ අන්තේවාසික වූ චන්දස් නිඝණ්ඩු ව්‍යාකරණාදියෙහි ද ධර්ම විනයෙහි ද අති දක්‍ෂ වූ සපරගමු දිසාවෙහි පටන් මුහුදු කෙළවර කොට ඇති සියළු මහාසංඝයාට නායක පදවිය කරවන අල්පෙච්ඡ සන්තුෂ්ටාදී ශ්‍රමණ ගුණගණාලංකාර සමලංකෘත වේහැල්ලේ ධම්මදින්න තෙරුන්නාන්සේ විසින් පස්වා දහසක් පවත්නා සර්වඥ ශාසනාභිවෘද්ධි වර්ධනය පිණිස ත්‍රිපිටක බුද්ධ වචනයට අන්තර්ගත වූ පෙළ-අටුවා-ටීකා ආදී වූ සියළු පොත් වහන්සේලා ත් ලියවමින් මනෝරථපූරණී නම්වූ මේ අංගෝත්තර අටුවා පොත් වහන්සේ ත් බුද්ධ වර්ෂයෙන් දෙදාස් තුන්සිය පහළොස් වන වර්ෂයෙහි (1772) දී

ලියවන ලද්දේය" (ඤාණවිමල හිමි, 1975: 56) යනුවෙනි. මීට අමතරව සික්ඛාපද වලඤ්ජනිය නම් ග්‍රන්ථයක්ද වෙහැල්ලේ හිමියන් විසින් රචනා කොට තිබේ (ඤාණවිමල හිමි, 1975: 54). මේ ආකාරයට පහතරට සිට උඩරටට ගොස් පහතරට ප්‍රදේශයේ වෙහැල්ලේ පරපුර නමින් භික්ෂු පරපුරක් අරම්භ කරමින් ආගමික වශයෙන් සහ අධ්‍යාපනික වශයෙන් විශාල ප්‍රබෝධයක් ඇතිකරවීමට වෙහැල්ලේ ධම්මදින්න හිමියෝ සමත් වූහ.

වෙහැල්ලේ හිමියන්ගේ ශිෂ්‍යයෙක් ලෙස පූර්වයෙන් හඳුන්වා දෙන ලද කඹුරුපිටියේ ගුණරතන හිමියන් වෙහැල්ලේ හිමියන්ගේ අනුප්‍රාප්තිකයා ලෙස පහතරට නායකත්වය ගනිමින් කටයුතු සිදු කොට තිබේ. වෙහැල්ලේ හිමියන් සමගම නුවර මල්වතු විහාරයට ගොස් එහිදී උපසම්පදාව ලබා "දුම්බර දී කීර්ති ශ්‍රී රාජසිංහ නරෝත්තමයාණන් ප්‍රමුඛ ඇමති සෙන් සහිත වූ මහ සඟ පිරිස් මැද සඟිධර්මය වික්ෂිප්ත නොවී මුඛපාඨ වශයෙන් දේශනා කොට සභාරඤ්ජනය කළ තැන් පටන් 'සඟිධර' යන රාජකීය ගෞරව නාම සම්මුතියෙන් සම්මානිත වූයේය" (ඤාණවිමල හිමි, 1975: 63). එසේ රාජකීය සම්මානයෙන් පුද ලත් ගුණරතන හිමියන්, වෙහැල්ලේ හිමි අපවත් වීමෙන් පසු දකුණු සහ සබරගමු දිශාවන්හි සංඝනායක පදවියටත් ශ්‍රී පාදය, කුට්ටාපිටිය, පැල්මඩුල්ල යන විහාරස්ථානයන්හි අධිපතිත්වයටත් පත්කරනු ලැබුණි (පියනන්ද හිමි, (සංස්.) 1969: 36). එම පත්වීම ලබා ඇත්තේ 1775 මැයි 28වන දිනය. එතැන් පටන් වෙහැල්ලේ හිමියන් නායකත්වය ලබා දුන් ආගමික සහ අධ්‍යාපනික ක්ෂේත්‍රයට නායකත්වය ලබා දෙමින් මෙම හිමියෝ ක්‍රියා කළහ. වේපතඉර, කුඩා මාලිම්බඩ, කුඩා කඹුරුපිටියේ, කුට්ටාපිටියේ යනාදී ග්‍රාම නාම නියෝජනය කරන ශිෂ්‍ය පිරිසක්ද ගුණරතන හිමියන් විසින් නිර්මාණය කෙරිණි (හේවාවසම්, 1966: 46). සබරගමුවට අයත් වන පොත්ගුල් විහාරය ස්වකීය නායකත්වය යටතේ ප්‍රතිසංස්කරණය කරමින් විශාල දියුණුවක් ඇති කළ මුන්වහන්සේ උක්ත ශිෂ්‍යයන් ඇතුළත් කොට පොත්ගුල් විහාර පරපුර නමින් නව භික්ෂු පරම්පරාවක්ද ඇති කළහ. ශාස්ත්‍රීය වශයෙන් ලේඛනයෙහි නියැලී ඇති බවට සාධක ලෙස හත්ථිපදෝපම සහ කාළකාරාම ආදි සූත්‍රයන්ට සන්න ලියා තවත් බොහෝ පොත් පත් ශුද්ධ කොට නැවත ලියා තැබීමෙන් පැහැදිලිවේ (ඤාණවිමල හිමි, 1975: 64). මේ ආකාරයට පහතරට ප්‍රදේශයේ අධ්‍යාපනික ප්‍රගතිය පිණිසත්

බෞද්ධාගමික ප්‍රබෝධය පිණිසත් කටයුතු කළ කඹුරුපිටියේ ගුණරතන හිමියෝ 1780 අප්‍රේල් 15වන දින අපවත් වූහ.*

වෙහැල්ලේ හිමියන්ගේ ශිෂ්‍යයෙකු වූ පූර්වෝක්ත පල්ලත්තර පුඤ්ඤසාර හිමියන් විසින් හම්බන්තොට දිස්ත්‍රික්කයේ බෙලිඅත්ත නගරයට ආසන්නව පල්ලත්තර විහාරය සහ ගොඩවෙල විහාරයත් ගාල්ලේ කච්චිවත්ත විහාරය සහ හික්කඩුවේ තෙල්වත්තේ තොටගමු පුරාණ රහත්පත් විහාරයත් යන ස්ථාන සතර සංවර්ධනය කොට දියුණු කළේය (ඤාණවිමල හිමි, 1975: 81). මෙම විහාරස්ථානයන්ගෙන් තොටගමු පුරාණ රහත්පත් විහාරය** පහතරට අධ්‍යාපනික හා ආගමික දියුණුවේ ප්‍රබල කේන්ද්‍රස්ථානයක් බවට පසුකාලීනව වේගයෙන් සංවර්ධන විය. මෙම විහාර පරම්පාරව විසින් මතු සාකච්ඡා කෙරෙන විද්‍යෝදය පිරිවෙනෙහි පරිවෙණාධිපති ධූරය දැරූ භික්ෂූන් පස්නමක් ශ්‍රී පාදස්ථානයේ නායක පදවිය දැරූ භික්ෂූන් තුන් නමක් ශ්‍රී පාදස්ථානය සහිත සබරගමු සංඝ නායක පදවිය හා සබරගමු සංඝ නායක පදවිය පමණක් දැරූ භික්ෂූන් දෙනමක් ඇතුළු වියත් තෙරවරුන් රැසක් බිහිකරන ලදී (ඤාණවිමල හිමි, 1975: 81).

පහතරට අධ්‍යාපනික ක්ෂේත්‍රයේ ප්‍රබෝධය ඇති කරවීම සඳහා ප්‍රබල දායකත්වයක් මෙන්ම නායකත්වයක් සැපයූ වෙහැල්ල පරපුර නියෝජනය කළ තවත් භික්ෂුවක් ලෙස කරතොට ධම්මාරාම හිමියන් හඳුනාගත හැකිය. සංඝරාජ සාධු චරියාවේ දැක්වෙන ආකාරයට කරතොට හිමියන්ගේ ශාසනික උරුමය ඇරඹෙන්නේ පහතරට ආගමික සහ අධ්‍යාපනික ප්‍රබෝධයේ ප්‍රමුඛයෙකු වූ සිටිනාමළුවේ ධම්මජෝති

* කිරිඇල්ලේ ඤාණවිමල හිමියන් පෙන්වාදී ඇතතේ මෙම හිමියන් මල්වතු විහාරයේදී අපවත් වූ බවයි එහෙත් ප. බ. ජී. හේවාවසම් පෙන්වාදී ඇත්තේ සබරගමු පොත්ගුල් විහාරයේදී අපවත් වූ බවයි. මෙම මත දෙකෙන් කිරිඇල්ලේ හිමියන්ගේ මතය නිවැරදි බව පෙනී යයි. එයට හේතුව වන්නේ මහනුවර මල්වතු විහාරයේ වැඩ සිටිද්දී දැඩි ලෙස රෝගාතුරව සිටින බව දක්වමින් ස්වකීය ශිෂ්‍යයෙකු වූ පැල්මඩුල්ල විහාරයේ වැඩසිටි කුඩාකඹුරුපිටියේ හිමියන්ට 1779 පෙරවාරි 10වන දින ලිපියක් යවමින් ස්වකීය අවසන් කැමැත්ත ප්‍රකාශකොට තිබීමයි. ඉන් පැහැදිලි වන්නේ ගුණරතන හිමියන් ජීවිතයේ අවසන් සමයේ මල්වතු විහාරයේ වැඩ සිටි බවයි

** 2019 05 18 දින 2563වන රාජ්‍ය වෙසක් උත්සවය පවත්වන ලද්දේ මෙම විහාරස්ථානයේය.

හිමියන්ගේ පරපුර හා සම්බන්ධ වෙමිනි (පියනන්ද හිමි, (සංස්.) 1969: 37).* උන්වහන්සේගේ ශිෂ්‍යවරයෙකු වූ පූර්වෝක්ත කදුරුපොකුණේ සුවණ්ණජෝති හිමියන් මාතර වෙරගම්පිට විහාරයේ වැඩ සිටියේය. දෙමාපියන් විසින් කරතොට හිමියන් එම හිමියන්ට බාර කරන ලදුව පැවිද්ද ලබාදී  ධම්මාරාම යන නාමකරණයද කොට වැඩිදුර අධ්‍යාපනය සඳහා මල්වතු මහා විහාරයට යොමු කෙරුණි (නන්දාරාම හිමි, 1940.:07). එහිදී අත්තරගම රාජගුරු බණ්ඩාර පඬිතුමා යටතේ අධ්‍යාපනය හදාළ කරතොට හිමියෝ ප්‍රාචීන භාෂාවන්හි වියතෙක් බවට පත්වූහ. ඉන් පසු බණ්ඩාර ගුරුතුමාගේ ඉල්ලීමට අනුව මල්වතු විහාරයේම වාසය කරමින් ගිහි පැවිදි ශිෂ්‍යයන්ට ශාස්ත්‍රප්‍රදානය සිදු කළහ (ඤාණවිමල හිමි, 1975: 75).

මේ අතරතුර පහරට සංඝ නායක පදවිය දැරූ කඹුරුපිටියේ ගුණරතන හිමියන් අපවත් වූ බැවින් එම ධුරයට කරතොට හිමියන් පත්කරන ලද බව සංඝරාජ සාධුචරියාව පදනම් කරගනිමින් ප. බ. ජී. හේවාවසම් පෙන්වා දෙයි (හේවාවසම්, 1966: 57). එහෙත් එබන්දක් සංඝරාජ සාධු චරියාවේ සඳහන් නොවේ. කෙසේ නමුත් එකී තනතුර සඳහා කරතොට හිමියන් තරම් සුදුස්සෙකු ඒවන විට නොසිටි බැවින් අනිවාර්යයෙන්ම උන්වහන්සේ මෙම තනතුරට පත්වන්නට ඇත. ඒ බව කරතොට වත සහ කිරිඇල්ලේ ඤාණවිමල හිමියන් තහවුරු කරයි (නන්දාරාම හිමි, 1940: 14 ඤාණවිමල හිමි, 1975: 77).** එසේම කඹුරුපිටියේ ගුණරතන හිමියන්ගෙන් පසුව ශ්‍රී පාදස්ථානයේ අධිපතිවරයාව සිටි මාලිම්බඩ ධම්මධර හිමියන් උපැවිදි වූ බැවින් එම

---

* "තවද හිටිනාමඑවේ උන්නාන්සේගේ ශිෂ්‍ය වූ කදුරුපොකුණේ වහන්දැගේ අන්තේවාසී වූ කරතොට උන්නාන්සේ ද."

** කෙසේ නමුත් මෙම කෘතීන්හි කරතොට හිමියන්ට මෙම තනතුරු ලැබීමේ වර්ෂ සහ ලැබුණු ආකාරය පිළිබඳව එක අදහසක් දක්නට නැති වේහැල්ලේ ධම්මදින්න ස්වාමීන්ද්‍ර ශාසන ඉතිහාසය කෘතියේදී කිරිඇල්ලේ ඤාණවිමල හිමියන් පහතරට නායක කම 1780දී ලැබුණු බව දක්වන අතර මාතර යුගයේ සාහිත්‍ය ධරයන් හා සාහිත්‍ය නිබන්ධන කෘතියේදී  ප. බ. ජී. හේවාවසම් සහ කරතොට වත පවසන්නේ එය ලැබුණේ 1779දී බවයි. එසේම කරතොට වතෙහි ධම්මාරාම හිමියන්ට විරුද්ධව මල්වතු මහා විහාරීය භික්ෂූන් රජුට කේලම් කියූ බවක් සඳහන් නොවේ. රාජ උදහසට ලක් වූ බව සඳහන් වේ. කිරිඇල්ලේ හිමියන්ගේ කෘතියේ රාජ උදහසක් පිළිබඳ තොරතුරු අන්තර්ගත නොවන අතර මල්වතු විහාරීය භික්ෂූන් ධම්මාරාම හිමියන්ට විරුද්ධව රජුට කේළම් කියූ බව සඳහන් වේ.

තනතුරද හිස් විය. මීට කලින් පැවති සම්ප්‍රදාය වූයේ පැල්මඩුල්ල, කුට්ටාපිටිය, සමනළගල සහ පහතරට නායක පදවිය එක් භික්ෂුවකට හිමි වීමයි. එහෙත් කඹුරුපිටියේ ගුණරතන හිමියන්ගේ අවෑමෙන් එකී සම්ප්‍රදාය වෙනස්ව තිබුණි. ඒ අනුව එම තනතුර මේ වන විට පහත රට නායක පදවියට පත්ව සිටි කරතොට හිමියන්ට නිතැතින්ම හිමිවිය යුතුව තිබුණි. එහෙත් මෙම අවස්ථාවේ ශ්‍රී පදස්ථානයේ අධිපතිත්වය සඳහා ඒ වන විට මල්වතු මහානායක හිමියන්ව සිටි මොරතොට ධම්මක්ඛන්ධ හිමියන් සහ වැලිවිට කුඩා උන්නාන්සේද* ඉදිරිපත් වූහ. කෙසේ නමුත් එම තනතුර කරතොට ධම්මාරාම හිමියන්ට හිමි විය. මෙම සමය වනාහි පහතරට ලන්දේසි අධිපත්‍යයට නතුව පැවති බැවින් මල්වතු හිමිවරු කරතොට ලසිංයාට පක්ෂය යනුවෙන් රාජාධිරාජසිංහ රජුට ගතු කියූහ. එම වදන් විශ්වාස කළ රජු කරතොට හිමියන් අත්අඩංගුවට ගෙන නායක පදවියෙන් ඉවත් කොට එය මොරතොට හිමියන්ට ලබාදී කටුගස්තොටින් එපිට සිරගත කොට තිබේ (වනරතන හිමි, 1950: 161-164).

මෙම සිරගත කිරීමෙන් ගැලවීම සඳහා ස්වකීය ගුරුවරයා වූ අත්තරගම රාජගුරු බණ්ඩාර පඬිතුමාගේ උපදෙස් පරිදි කටයුතු කළ කරතොට හිමියන් ස්වකීය පාණ්ඩිත්‍යය හෙළි කිරීම සඳහා දුෂ්කර පද්‍ය බන්ධනයක් කොට රජුට යැවීය. එය 'බාරස කාව්‍ය' නමින් ප්‍රචලිතය (වනරතන හිමි, 1950: 45-52). රජුට හෝ රාජ සභාවේ කිසිවෙකුට මෙම දුෂ්කර පද්‍ය බන්ධනය නිරාකරණයට නොහැකි වූ බැවින් කරතොට හිමියන් රාජ සභාවට කැඳවීය. උන්වහන්සේ විසින් එම කාව්‍ය ප්‍රහේලිකාව විසඳීම පිළිබඳව විස්මයටත් ප්‍රසාදයටත් පත් රාජාධිරාජසිංහ රජු සබරගමුවට අයත් සංබපාල විහාරය සහිත අක්කර දහතුන් දහසක් විශාල පල්ලේබැද්ද විහාර ගම එම හිමියන්ට පූජා කළේය (ඥාණවිමල හිමි, 1975: 78-79). නැවතත් මොරතොට හිමියන් විසින් කරතොට හිමියන් ලංදේසීන් සමග සබඳතා පවත්වන්නේ යැයි රජුට ඒත්තුගැන් වූ බැවින් කරතොට හිමියන් අත්අඩංගුවට ගන්නැයි දොඩම්වල නිලමේට නියෝග කළේය. ඒ බව දැනගත් කරතොට හිමියන් ඒ වන විට ලන්දේසි පාලනය පැවති මාතර ප්‍රදේශයේ තමන් පැවිදි වූ විහාරස්ථානය වන වේරගම්පිට විහාරස්ථානයට වැඩමකොට ස්වකීය ආරක්ෂාව තහවුරු කරගත්හ (වනරතන හිමි, 1950: 161).

* වැලිවිට සරණංකර සංඝරාජ හිමියන්ගේ ඥාති මුණුබුරෙකි.

කරතොට වතෙහි දැක්වෙන ආකාරයට මෙම පැමිණීම සිදුව ඇත්තේ බුද්ධ වර්ෂ 2329දීය. එනම් ක්‍රි. ව. 1785දීය. උන්වහන්සේ මෙහි වැඩ සිටිමින් ලන්දේසි පාලකයන් සමග සබඳතා ඇති කරගැනීමට කටයුතු කොට තිබේ. ඒ වන විට පහතරට පාලනය කළ ලන්දේසි ආණ්ඩුකාරයා වූ විලෙම් ජේකබ් වන් ද ග්‍රාෆ් (1785-1794) වෙත ඒ හිමියන් විසින් ආශිර්වාදාත්මක ලිපියක් යැවීය. ඒ පිළිබඳව ප්‍රසන්න වූ ආණ්ඩුකාරවරයා කරතොට හිමියන්ගේ පහතරට නායක පදවිය ස්ථිර කර සිවුපසය පිණිස මාස් පතා පතාග 25ක දීමනාවක් ලබා දීමට නියෝගකර ඔවුන්ගේ පාලන සමය අවසන් වන තෙක් එය ලබාදීමට කටයුතු කොට ඇත (නන්දාරාම හිමි, 1940: 19). එහෙත් ප. බ. ජී. හේවාවසම් පවසන්නේ මෙය තහවුරු කරන කිසිදු ලේඛනයක් නොමැති බවයි (හේවාවසම්, 1966: 58-59). මින් පසුකාලීනව රොබට් බ්‍රවුන්රිග් නම් ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයාට 1827 ජනවාරි 02දින කරතොට හිමියන් විසින් යවන ලදැයි සැලකෙන ලිපියක එන ප්‍රවෘත්තිවලට අනුව උන්වහන්සේට ඉංග්‍රීසි රජයෙන්ද පහතරට නායක පදවිය සමග පතාග තිස්හතක පඩියක්ද ලැබුණු බව කියවෙයි (වීරසූරිය, 1951: 38-39 ඤාණවිමල හිමි, 1975: 111). මේ ආකාරයට පහතරට පාලනය කළ සෑම පාලකයෙක් විසින්ම කරතොට හිමියන්ගේ නායකත්වය ස්ථිර කොට මාසික වේතන ලබාදීමට කටයුතු කිරීමෙන් පැහැදිලි වන්නේ උන්වහන්සේ බලවත් භික්ෂුවක් ලෙස තත්කාලීනව වැඩ සිටි බවයි.

සිංහල භාෂාවේ ප්‍රගමනයට විශාල සේවාවක් කළ මෙම හිමියෝ සිංහල අකුරුවල ශීර්ෂයන්ගේ හා පාදයන්ගේ සමතාවක් ඇති කිරීමෙන් සිංහල හෝඩියේ සංස්කරණයක්ද ඇති කළහ (හේවාවසම්, 1966: 59). එසේම පිරුවානා පොත, ධර්මරාජ අෂ්ටකය, කීර්ති ශ්‍රී රාජසිංහ අෂ්ටකය, ජෝර්ජ් රාජ අෂ්ටකය සහ පූර්වයෙන් දක්වන ලද බාරස කාව්‍ය ආදිය කරතොට හිමියන්ගේ සාහිත්‍ය නිර්මාණ ලෙස හඳුන්වා දිය හැකිය (හේවාවසම්, 1966: 59).

පහතරට අධ්‍යාපනික ක්ෂේත්‍රයේ ප්‍රබෝධය සඳහා විශාල මෙහෙවරක් ඉටු කළ කරතොට ධම්මාරාම හිමියෝ එකී මෙහෙවර සාධනීය ලෙස ඉදිරියට පවත්වාගෙන යාම සඳහා ප්‍රබල ශිෂ්‍ය පරපුරක්ද නිර්මාණය කළහ. කදුරුපොකුණේ සෝභිත, කදුරුපොකුණේ සුවණ්ණජෝති, කුඩා කරතොට ධම්මාරාම, ලාල්පේ අත්ථදස්සි වල්ගම

ශ්‍රී ධම්මානන්ද යන හිමිවරුන් උන්වන්සේගේ පැවිදි ශිෂ්‍යයන් වූ අතර උන්වහන්සේගෙන් අධ්‍යාපනය ලද භික්ෂූන් වහනසේලා ලෙස ඇලපාත ධම්මරතන, වලගෙදර ධම්මදස්සි, හෙට්ටිපොල සුමංගල, අක්මීමන සිරිධම්ම, ගාල්ලේ මේධංකර, බෙන්තොට අත්ථදස්සි, කටුකුරුන්දේ ධම්මානන්ද, මිහිරිපැන්නේ ධම්මරතන යනාදීහු හඳුනාගත හැකිය (පඤ්ඤාලෝක හිමි, 2002: 355-356). භික්ෂූන්ට අමතරව කරතොට හිමියන්ගෙන් අධ්‍යාපනය ලද්දවුන් ලෙස ලන්දේසි ආණ්ඩුකාර ඉවෝන් විලෙම් ෆෝක් (හේවාවසම්, 1966: 60), දෙවන පරිච්ඡේදයේදී සාකච්ඡාවට ගැනෙන ඉංග්‍රීසි පාලන සමයේ මාතර දිසාපති පදවිය සහ පසුව කන්ද උඩරට නිසි බලධරයා වූ ජෝන් ඩොයිලි (නන්දාරාම හිමි, 1940: 33) සහ ගජමන් නෝනා නමින් ප්‍රකට දෝන ඉසබෙලා පෙරුමාල් කොර්ණේලියා නම් කවිකාරිය (හේවාවසම්, 1966: 62) අකුරම්මාටුවගල අභයනායක කුරුප්පු මුදලි තැන (ඤාණවිමල හිමි, 1975: 112) යනාදින් හඳුනාගත හැකිය. මොවුන් සියලු දෙනාම පාහේ කරතොට හිමියන් වෙතින් අධ්‍යාපනය හදාරන්නේ උන්වහන්සේ වැඩවාසය කළ වේරගම්පිට විහාරස්ථානය පදනම් කරගිනිමිනි.

පූර්වයෙන් නම් සඳහන් කරන ලද පැවිදි ශිෂ්‍යයන් අතරින් කදුරුපොකුණේ සෝභිත හිමියන් වර්තමාන වීරකැටියට ආසන්න කසාගල විහාරයෙහිද කදුරුපොකුණේ සුවණ්ණජෝති හිමි වේරගම්පිට, සංඛපාල, මාතර කිතුලේවෙල යන විහාරයන්හිද වලගෙදර ධම්මදස්සී හිමි බෙන්තර බෙම් වෙහෙර රජමහ විහාරයෙහිද හෙට්ටිගොඩ සුමංගල හිමි ගනේගොඩ, අනුගොඩ, කතලුව යන ප්‍රදේශවල විහාරයන්හිද අධිපතිත්වය දරමින් එකී ප්‍රදේශයන්හි ආගමික සහ අධ්‍යාපනික ප්‍රබෝධය සඳහා ඍජුවම මැදිහත් වෙමින් වැඩකටයුතු සිදුකොට තිබේ (හේවාවසම්, 1966: 61).*

වේහැල්ල පරම්පරාවට අමතරව පහතරට අධ්‍යාපන ව්‍යාප්තියේදී තවත් සඟ පරපුරු තුනක් මූලිකත්වය ගනී. ඒ මුල්කිරිගල පරම්පරාව, රන්සෑගොඩ පරම්පරාව හා වැව පරම්පාවයි. මින් මුල්කිරිගල පරපුර හැරෙන්නට අනෙක් පරම්පරා දෙක එක් අතකට වේහැල්ල පරපුරේම දිගුවක් ලෙසටද සැලකිය හැකිය (හේවාවසම්,

* වේරගම්පිට, කිතුලවෙල යන විහාරස්ථානයන්හි එදා සිට වර්තමානය දක්වාම අධ්‍යාපනික ආයතන පවත්වාගෙන යනු ලැබේ.

1966: 61). වෙහැල්ලේ ධම්මදින්න හිමියන්ගෙන් අධ්‍යාපනය ලබා මල්වතු මහා විහාරයෙන් උපසම්පදාව ලබාගෙන මාතර හිත්තැටිය රජමහා විහාරයේ වාසය කළ වැව ඉන්දසර නම් භික්ෂුවකගෙන් වැව පරම්පරාව ආරම්භ වී ඇත (නන්දාරාම හිමි, 1940: 23). මෙම හිමියන්ගේ ශිෂ්‍යවරයෙකු බෙන්තර බෝධිමලු විහාරයේ නිත්‍යවාසයට පැමිණීමෙන් බෝධිමලු පරම්පරාව නමින් තත් ප්‍රදේශයේ තවත් භික්ෂු පරපුරක් ව්‍යාප්තවන්නට විය.

රන්සැගොඩ පරම්පරාව ආරම්භ කරන්නේ රන්සැගොඩ ධම්මදස්සි හිමියන් විසිනි. කඹුරුපිටියට ආසන්න ගමක් වූ රන්සැගොඩ හෙවත් රංචගොඩ උපන් මුන්වහන්සේ තම ගම ආසන්නයේ වූ කළුගල නම් වෙහෙර සමීපයේ ආරණ්‍යයක ගණින්නාන්සේ කෙනෙකු වශයෙන් මුලින් සිල් රැකීමෙහි නිරතව සිට ඇති අතර පසුව වෙහැල්ලේ ධම්මදින්න හිමියන්ගේ මග පෙන්වීම යටතේ වැලිවිට සංඝරාජ හිමියන් ඇසුරට ගොස් තිබේ (නන්දාරාම හිමි, 1940: 23). ඉන්පසුව වෙහැල්ලේ හිමියන්ගේ ශිෂ්‍යයෙකු ලෙස පැවිදි උපසම්පදාව ලබා ඇත (වනරතන හිමි, 1950: 160). මේ ආකාරයට මහනුවරින් අවශ්‍ය අධ්‍යාපනය සහ පැවිද්දේකුට අවශ්‍ය ශාසනික උරුමය ලබාගෙන යළිත් මාතරට පැමිණ කළුගල අසළ පල්ලාවෙල විහාරස්ථානය ස්වකීය වාසස්ථානය කරගනිමින් තත් ප්‍රදේශයේ ආගමික සහ අධ්‍යාපනික ප්‍රබෝධ සඳහා කටයුතු කොට තිබේ. මුන්වහන්සේ විසින් ප්‍රදේශවාසීන්ගේද සහය ඇතිව රිදී කලන් දහසක පහනක් නිර්මාණය කොට දළදා පූජාවක් උත්කර්ෂවත් ලෙස සිදු කළේය. මේ පිළිබඳව පැහැදුණු ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා ධම්මදස්සි හිමියන්ට 'කීර්ති ශ්‍රී තේජවර' යන ගෞරව නාමය සහිතව ගම්බිම් පූජාවක් සිදුකොට තිබේ (නන්දාරාම හිමි,1940: 26). එතැන් සිට උන්වහන්සේ වැඩ සිටි පල්ලාවෙල විහාරය කීර්ති ශ්‍රී තේජෝවරාරාමය නමින් ප්‍රසිද්ධියට පත්ව ඇත (හේවාවසම්, 1966: 86). ස්වකීය කාර්යාවලීන් ඉදිරියට රැගෙන යාම සඳහා මෙම හිමියන් විසින් තනන ලද ශිෂ්‍යයන් අතරින් සපුගොඩ සිද්ධාර්ථ සහ ලේනබටුවේ යන භික්ෂූහු කීර්තිමත් ශිෂ්‍යවරයෝ වූහ. මෙම ශිෂ්‍යයන් මාර්ගයෙන් විහාර පරම්පරා හා අධ්‍යාපන ආයතන දහහතරක් බිහි වූ බව විස්තර වේ(පඤ්ඤාලෝක හිමි, 2002: 361). ඒ යටතේ පහතරට අධ්‍යාපනික ක්ෂේත්‍රයට ස්වකීය දායකත්වය ලබා දෙමින් ග්‍රන්ථකරණයේ නියැළී කටයුතු කළ භික්ෂූන් ලෙස දෙනගම ධර්ම කීර්ති ශ්‍රී ගුණරතන, සාලිඇලේ මණිරතන,

අකුරැස්සේ සුවණ්ණජෝති, කිරම ධම්මානන්ද, පරපාමුල්ලේ ධම්මාරාම, ගල්ඇටුඹේ පියදස්සි යන භික්ෂූන් වහන්සේලා හඳුනාගත හැකිය (හේවාවසම්, 1966: 86-87). වර්තමානයේ පවා සම්භාවනාවට පාත්‍රවන සිදත් සඟරාවට විවරණයක් ලියූ ජේම්ස් ද අල්විස් පඬිතුමා මූලික අධ්‍යාපනය ලබන්නේද පූර්වෝක්ත ගල්ඇටුඹේ හිමියන්ගේ උපැවිදි ශිෂයයෙකු වූ ගැල්ඇටුඹේ කොට්ඨාස රාළහාමි නමැත්තෙකුගෙන්ය (හේවාවසම්, 1966: 90). සව්සත්දම්වාදයට මුල් වන කෘතිය වූ ගංගාරෝහණ වර්ණනාව රචනා කළ තෝමිස් සමරසේකර දිසානායක මුහන්දිරම්ද කළුගල විහාරයේදී සාල්යාලේ හිමියන්ගෙන් සහ පරපාමුල්ලේ හිමියන්ගෙන් අධ්‍යාපනය ලබා තිබේ (හේවාවසම්, 1966: 92).

සරණංකර සංඝරාජ හිමියන්ගෙන් ව්‍යාප්තීකරණයට ලක් වූ පහතරට භික්ෂු පරම්පරාවන්ගෙන් වෙහැල්ල පරම්පරාව තරම් පැතිරී නොගියත් බ්‍රිතාන්‍ය යටත්විජිත සමයේ පහතරට බලවත්ව සිටි භික්ෂු පරම්පරාවක් ලෙස මුල්කිරිගල භික්ෂු පරම්පරාව හඳුනාගත හැකිය. මෙම පරම්පරාවේ ආරම්භකයා වූයේ බෙලිඅත්තට නුදුරු වටරක්ගොඩ නම් ග්‍රාමයේ උපන් ධම්මපාල නම් තෙරනමකි. උන්වහන්සේ මුල්කිරිගල ගණින්නාන්සේ කෙනෙකු සමීපයේ පැවිදිව සිට මහනුවරට ගොස් අධ්‍යාපනය හදාරා සියමෙන් උපසම්පදාව රැගෙන පැමිණි උපාලි තෙරුන්ගෙන් උපස්මපදාව ලබාගෙන යළි ස්වකීය විහාරස්ථානයට පැමිණ එහි දියුණු කිරීම් කටයුතු සිදුකර තිබේ (පියනන්ද හිමි, 1969: 36-37).* මේ ආකාරයට වර්ධනය වන මුල්කිරිගල භික්ෂු පරම්පරාවේ බලවත්කම බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා විසින් මාතර ඒජන්ත තැන වෙත එවන ලද ලිපියකින් මනාව පැහැදිලි වේ. එහි දැක්වෙන්නේ "ඔය පළාතේ නොයෙක් කොටස් ඇත ද එයින් සතරක් පමණක් වැදගත් ලෙස සලකත් එනම් මුල්කිරිගල කොටස, වේහැල්ලේ නිකායේ තෙරුන්නාන්සේගේ කොටස, වැවසිංගම කොටස හා රන්සෑගොඩ තෙරුන්නාන්සේගේ කොටස ය. මේ සතරින් මුල්කිරිගල ප්‍රධානය. ඒ

* "මූලගිරි විහාරවාසී වූ වටරක්ගොඩ ධම්මපාල උන්නාන්සේ ද සංඝරක්ෂිත නායක උන්නාන්සේගෙන් ලීම් කීම් ඉගෙන එම උන්නාන්සේගෙන් ව්‍යාකරණ - චන්දස් - ප්‍රබන්ධ ක්‍රියා උගත් ඔකඳපොල විහාරවාසී දියහුන්නත ධම්මජෝති උන්නාන්සේගෙන් නැවත ව්‍යාකරණ ලියවා කියවා ගැන්මෙන් සමර්ථව උපාලි මහාස්ථවිර සාමීන්ගෙන් ලබන ලද උපසම්පදාව ඇතිව ධර්මවිනේ ඉගෙනීමෙන් සඟි අටුවා ආදී බොහෝ පොත්පත් ලියවීමෙන් ශිෂ්‍යගණයාත්."

පංතියට අයත් ප්‍රධාන ආරාමය තංගල්ලෙන් සැතපුම් දහයක් ඔබ්බෙන් ගිරුවාපත්තුවේ පිහිටා තිබේ. මේ දිවයිනේ බ්‍රිතාන්‍ය පෙදෙසෙහි මුදලින් හා ඉඩම්වලින් ඉතා පොහොසත් ස්ථානය ද මෙයයි. සියලු සිංහලයෝ මේ ස්ථානයට ඉමහත් ගෞරවයක් දක්වති. බ්‍රිතාන්‍ය බලය යටතේ අප සිටින්නාක් මෙන් ඔවුහු ද ගිවිසුම් රාජ්‍යක් තුළ සිටින්නාක් මෙන් ඔවුන්ගේ බලය යටතේ සිටිති. මේ පන්සලේ සිටින භික්ෂූන්ට මේ රට තුළ විශාල බලයක් තිබේ. ඔබේ පළාතේ ඕලන්ද ආණ්ඩුවට එහි ප්‍රතිඵල නිතර විඳින්නට සිදු විය. මේ භික්ෂු බලය මහනුවර රජුට භක්තිමත්ව තබාගැනීමට උත්සාහ කරන දේශපාලන යාන්ත්‍රණයකි...." (වනරතන හිමි, 1950, 40) යනාදි වශයෙනි.

මේට්ලන්ගේ උක්ත ප්‍රකාශනය විසින් පැහැදිලිවම මුල්කිරිගල පරපුරේ භික්ෂූන් සතු වූ බලයේ ප්‍රමාණය තක්සේරු කරයි. එකී බලය එම පරපුර විසින් ගොඩනගාගෙන ඇත්තේ සමාජ ක්‍රියාකාරීන් වශයෙන් ඉටුකරන ලද සේවයේ ප්‍රතිඵලයක් ලෙස බව වටරක්ගොඩ ධම්මපාල හිමියන්ගේ ක්‍රියාකාරකම් අධ්‍යයන කරනවිට පැහැදිලි වේ. උන්වහන්සේ විසින් මුල්කිරිගල පවත්වාගෙනෙ ගිය අධ්‍යාපන ආයතනයේ ශිෂ්‍යයන් පනස්දෙනෙකුට වැඩි පිරිසක් අධ්‍යාපනය ලබමින් සිට ඇත (විපරම් පත්‍ර, 5/63/9-17, SLNA). දහඅටවන සියවසේ අගභාගයේ මෙතරම් ශිෂ්‍ය පිරිසක් සහිත අධ්‍යාපන ආයතනයක් පවත්වාගෙන යාමෙන් පෙනීයන්නේ මුල්කිරිගල භික්ෂුව තත්කාලීනව කැපීපෙනෙන සමාජ සේවයක නියැලී ඇති බවයි. ධම්මපාල හිමියන් යටතේ පැවිදි උපසම්පදාව ලැබූ දොළොස් නමක් යටතේ විහාර පරම්පරා සංවර්ධනයට ලක්ව ඇත. ඒ තේනාගම චන්දජෝති, නලගම මණිරතන, ගංගොඩගම දේවරක්ඛිත, කටුවන අත්ථදස්සි, මහකෝට්ටවත්තේ සුමන, මල්ගාගොඩ ආනන්ද, වේපතඉර ඉන්දසාර, වටරක්ගොඩ ධම්මධර, මීගහවෙල බුද්ධරක්ඛිත යන හිමිරුන් හා උක්ත මණිරතන හිමියන්ගේ ශිෂ්‍ය බෝවල ධම්මානන්ද හිමි යනාදීන් යටතේ සංවර්ධිත විහාර පාර්ශ්වයන්ය (පඤ්ඤාලෝක හිමි, 2002: 359-380). වටරක්ගොඩ ධම්මපාල හිමියන් විසින් සරණංකර සංඝරාජ හිමියන් වෙත යවන ලද විපරම් පත්‍රයක පැහැදිලිවම සඳහන් කොට ඇත්තේ ස්වකීය ශිෂ්‍යවරයන් වාසය කරන විහාරස්ථානයන් අධ්‍යාපනය ලබාදෙන ආයතන වශයෙන් ක්‍රියාත්මක වී ඇති බවයි (විපරම් පත්‍ර, 5/63/9-17, SLNA).

උක්ත භික්ෂූන් අතරින් වේපතඉර හිමියන් සහ බෝවල හිමියන් සංරණංකර සංඝරාජ හිමියන්ගේ නියෝගයෙන් මල්වත්තේ පෝයමළු විහාරයේ නායකත්වයට පත් දැරම්ටිපල ධම්මරක්ඛිත හිමියන්ගෙන් අධ්‍යාපනය ලැබූ බව සංඝරාජ සාධු චරියාවේද සඳහන්වේ (පියනන්ද හිමි, 1969: 47). මෙම අධ්‍යාපනය ලැබීමෙන් පසු මාතර තිහගොඩ ප්‍රදේශයේ පෙතංගහවත්ත විහාරස්ථානය නිත්‍ය වාසස්ථානය කරගනිමින් කටයුතු කළ බෝවල ධම්මානන්ද හිමියන් ඉංග්‍රීසි පාලකයන්ගේ පවා විශේෂ අවධානයට ලක් වූ භික්ෂුවකි (වනරතන හිමි, 1950: 91). තෝමස් මේට්ලන්ඩ් ආණ්ඩුකාරවරයාගේ උපකල්පනයට අනුව මහනුවර රාජධානිය සහ පහතරට අතර සබඳතා පැවැත්වීමේ මැදිහත්කරු මෙම බෝවල හිමිය. කෙසේ නමුත් 1834දී පහතරට සංඝනායක පදවියට බෝවල හිමියන් පත්ව තිබේ (වනරතන හිමි, 1950: 168). විශාල ශිෂ්‍ය පිරිසක් නිර්මාණය කිරීමට මෙම හිමියන් සමත්ව නැතත් උන්වහන්සේ වෙතින් අධ්‍යාපනය ලද ශිෂ්‍යයෝ තත්කාලීන සමාජයේ ආගමික හා අධ්‍යාපනික කාර්යයන් සඳහා සධනීය බලපෑම් කිරීමට සමත්ව ඇත. පැරකුම්බා සිරිත, මුවදෙව්දාවත ආදි ග්‍රන්ථ ශුද්ධ කොට පළ කිරීමෙන් හා සිංහල බෞද්ධයා පත්‍රයේ කතෘ ධූරය දැරූ මාතර බටුවිට ඩී. ජී. අභය ගුණරත්න රාළහාමි බෝවල හිමියන්ගේ උපැවිදි ශිෂ්‍යයෙකි (වනරතන හිමි, 1950: 168). ශ්‍රී ලංකාවේ අමරපුර නිකාය ආරම්භ කළ අඹගහපිටියේ ඤාණවිමලතිස්ස හිමි, කල්‍යාණී වංශය නම් භික්ෂු නිකාය ආරම්භ කළ කතළුවේ ගුණරතන තිස්ස හිමි හා අමරපුර ධම්මරක්ඛිත වංශය පිහිට වූ අත්තුඩාවේ ධම්මරක්ඛිත හිමි යනාදි භික්ෂූන් වහන්සේලා බෝවල හිමියන්ගේම පැවිදි ශිෂ්‍යයන් නොවුනත් උන්වහන්සේලාගේ ගුරුවරයා ලෙස අධ්‍යාපනය හා භික්ෂු ජීවතයට අවශ්‍ය මගපෙන්වීම් ලබා දෙමින් කටයුතු කර ඇත. මේ අනුව පෙනෙන්නේ දහනවවන සියවසේ පහතරට පදනම් කර ගනිමින් විවිධ නිකායන් ඇති වීමටත් බෞද්ධාගමික සහ අධ්‍යාපනික ප්‍රබෝධයටත් මුල්කිරිගල භික්ෂු පරම්පරාව සෘජු දායකත්වය ලබාදී ඇති බවයි.

වේහැල්ල භික්ෂු පරම්පරාවේ ව්‍යාප්තියක් සබරගමු පළාත පදනම් කරගනිමින්ද සිදු විය. සරණංකර සංඝරාජ හිමිගේ අනුදැනුම මත රාජාධිරාජසිංහ රජුගෙන් වේහැල්ලේ ධම්මදින්න හිමියන්ට හිමි වූ ශ්‍රීපාද පදවිය ප්‍රමුඛ පැල්මඩුල්ල, කුට්ටාපිටිය විහාරයන්හි අධිපතීත්වය

කරතොට ධම්මාරාම හිමියන්ගෙන් පසුව වෙහැල්ල පරපුරට අහිමි වී යන්නේ කරතොට ලංසියාට පක්ෂ යැයි චෝදනාව මත උන්වහන්සේ මාතරට පැමිණ දිවි ගෙවීමේ සිදුවීම හේතුවෙනි. වසර විසි දෙකක් පමණ එකී ස්ථානයන්හි අධිපතිත්වය තිබූයේ මල්වතු මහා විහාරය යටතේය (ඥාණවිමල හිමි, 1964: 88). එහෙත් ඉංග්‍රීසි ආණ්ඩුව බලයට පත්වීමෙන් පසු වෙහැල්ල සංඝපරපුර විසින් ශ්‍රීපාදස්ථානයේ නායක පදවිය සම්බන්ධයෙන් පෙත්සමක් ඉදිරිපත් කෙරුණි. එම පෙත්සම විභාග කිරීමෙන් අනතුරුව එම පදවි වෙහැල්ලේ පරපුරට උරුම විය යුතු බව තීරණය කළ ඉංග්‍රීසි ආණ්ඩුව 1826. 02. 25 දින පැල්මඩුල්ල විහාරය ඇතුළු ශ්‍රීපාදයේ අධිපතිත්වයට ගාල්ලේ මේධංකර හිමියන් පත් කෙරුණි.* එසේම එම වර්ෂයේ ම සැප්තැම්බර් දාහත්වන දින පහතරට සංඝ නායක පදවියටද පත් කෙරුණි (ඥාණවිමල හිමි, 1975: 129).

පදවි ලැබීමෙන් පසු පැල්මඩුල්ල විහාරයට වැඩම කළ මේධංකර හිමියන් එහි අධ්‍යාපන ආයතනයක් ආරම්භ කළේය. එයින් අධ්‍යාපනය ලද්දවුන් වශයෙන් ඉඳුරුවේ සුමංගල, වලානේ සිද්ධාර්ථ, දොඩම්පහළ දීපංකර, වස්කඩුවේ සුභූති හා මීගහගොඩ රතනපාල යන භික්ෂූන් හඳුනාගත හැකිය (වනරතන හිමි, 1950: 165). මේධංකර හිමියන්ගේ අපවත් වීමෙන් පසු සුමංගල හිමියන් තත් අධ්‍යාපන ආයතනය ඉදිරියට පවත්වාගෙන ගිය අතර දීපංකර හිමියන් මාතරට පැමිණ බඹරැන්දේ ගල්කන්ද විහාරයේ සුධර්මෝදය නමින් අධ්‍යාපන ආයතනයක් ආරම්භ කළේය. රතනපාල හිමියන් මීගොඩට පැමිණ එහි අධ්‍යාපන ආයතනයක් ආරම්භ කළේය. සුභූති හිමියන් ලෝකයටම අධ්‍යාපනය බෙදාදෙන අග්‍රගණ්‍ය වියතෙක් ලෙස කටයුතු කළේය.

වලානේ සිද්ධාර්ථ හිමියෝ අධ්‍යාපනය ලැබීමෙන් අනතුරුව 1838දී පමණ වලානේ සිද්ධත්ථාරාමයට පැමිණ එහි අධ්‍යාපන ආයතනයක් ආරම්භ කළහ (පඤ්ඤාලෝක හිමි, 2002: 365). මෙම

* "මහ රාජෝත්තමයන් වහන්සේගෙන් අපට ලැබී තිබෙන්නා වූ බලේ කරණකොට ගාල්ලේ මේධංකර උන්නාන්සේගේ තිබෙන්නා වූ පක්ෂවාදීකමද ඇදහිලිවන්තකමද උගත්කමද විශ්වාසකමද හොඳ ආකාර අදහාගෙන මෙම ගාල්ලේ මේධංකර උන්නාන්සේ අපේ කැමැත්ත තිබෙන තුරු ශ්‍රී පාදස්ථානයේ ඇතුළුව ඊට අයිති ගම්වලටද නායක පදවිය කරනා හැටියට අප විසින් නියම කරන්ඩ සහ පත් කරන්නඩ ද යෙදුනාය."

අධ්‍යාපන ආයතනයෙන් උඩුගම්පොල රතනපාල, බද්දේගම සරණංකර, වෙරහැර සොභිත, මාලේවන සෝභිත, තලංගල, පැල්පල, ගණේගොඩ, වැලිකැටැල්ලේ, කෝහගොඩ යන භික්ෂූන් සහ දොන් අන්ද්‍රියස් ද සිල්වා බටුවන්තුඩාවේ පඬිතුමා ආදී ශිෂ්‍යයන් බිහි කරලීමට වලානේ හිමියෝ සමත් වූහ (බුද්ධදත්ත හිමි, 1964: 71). 1839 දී පමණ රත්මලානේ ප්‍රදේශවාසීන් කිහිපදෙනෙකුගේ ආරාධනාව පරිදි එම ප්‍රදේශයේ පරමධම්මචේතිය නමින් පිරිවෙනක් ආරම්භ කළේය. කෝට්ටේ යුගයෙන් පසු පිරිවෙන නමින් ආරම්භ කරනලද අධ්‍යාපන ආයතනයක් පිළිබඳව අසන්නට ලැබෙන්නේ මෙම ආරම්භ කිරීමත් සමගිනි (හේවාවසම්, 1966: 73). මෙම ආරම්භය ශ්‍රී ලාංකේය අධ්‍යාපන ක්ෂේත්‍රයේ නවමු මාවත් විවර කිරීමේ කේන්ද්‍රස්ථානය බවට ඉතා කෙටිකලකින්ම පත්වන්නේ විශාල ශිෂ්‍ය පිරිසකට අධ්‍යාපනය ලබා දීමත් සමගිනි.

## නිගමනය

මේ ආකාරයට දහනවවන සියවසේ මුල් භාගය වන විට සරණංකර සංඝරාජ හිමියන්ගේ ශිෂ්‍ය පරම්පරා විසින් ගොඩනගන ලද ශිෂ්‍යයන්, විහාරස්ථාන හා අධ්‍යාපන ආයතන පදනම් කරගනිමින් පහතරට ප්‍රදේශය පුරා ක්‍රියාත්මක කරන ලද වැඩ පිළිවෙළ පදනම් කරගනිමින් බෞද්ධාගමික ප්‍රබෝධයකුත් විශේෂයෙන්ම ශාස්ත්‍රීයමය වශයෙන් දීප්තියකුත් ඇතිවීමට පටන්ගෙන තිබූ බව හඳුනාගත හැකිය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

ජයතිලක, ඩී. බී. (1955). සිංහල සාහිත්‍ය ලිපි. කැළණිය: ඩී. සී. සහ ඩී. ඇන්. ජයතිලක.

ඤාණවිමල හිමි, කිරිඇල්ලේ (1975). වේහැල්ලේ ශ්‍රී ධම්මදින්න ස්වාමීන්ද්‍ර ශාසන ඉතිහාසය. ප්‍රකාශන ස්ථානය හෝ ආයතනය සඳහන් නොවේ.

ඤාණවිමල හිමි, කිරිඇල්ලේ (1964). සබරගමුවේ පැරණි ලියවිලි, කිරිඇල්ල: ජේ. ඇම්. සමරකෝන් බණ්ඩාර.

නන්දාරාම හිමි, වේගම්පිට (1940). කරතොට වත. මාතර: එච්. ඩී. කුලතුංග.

පඤ්ඤාලෝක හිමි, මීගොඩ (2002). ශ්‍රී ලංකාවේ බෞද්ධ අධ්‍යාපන සම්ප්‍රදාය. කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ලංකානන්ද හිමි, ලබුගම (1996). (සංස්.) මන්දාරම් පුර පුවත. බත්තරමුල්ල: සංස්කතික කටයුතු දෙපාර්තමේනතුව.

වනරතන හිමි, කඹුරුපිටියේ (1950). මාතර මානව වංශය. ප්‍රකාශිත ස්ථානය සඳහන් නොවේ: ඩී. එම්. කරුණානායක.

වීරසූරිය, පී. ඩී. එස්. (1951). මාතර සාහිත්‍ය වංශය. වලස්මුල්ල: ඩී. එම්. ජේ. විජේසූරිය.

හේවාවසම්, ප.බ.ජී. (1966). මාතර යුගයේ සාහිත්‍යධරයන් හා සාහිත්‍ය නිබන්ධන. සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

පියනන්ද හිමි, හේන්පිටගෙදර (1969). (සංස්.) සංඝරාජ සාධුචරියාව. කොළඹ: රත්න පොත්ප්‍රකාශකයෝ.

ප්‍රඥාතිස්ස හිමි, මාගොල්ලාගොඩ (1948). (සංස්.) ස්‍යාමෝපසම්පදාවත. ප්‍රකාශිත ස්ථානය සඳහන් නොවේ: බ්‍රෝඩ්වේ යන්ත්‍රාලය.

සිල්වා, චාල්ස් ද (1955). (සංස්.) සඟරජවත. කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

විපරම් පත්‍ර, 5/63/9-17ල ජාතික ලේඛනාරක්ෂක අධිකාරිය.

විපරම් පත්‍ර, 5/63/9-17, ජාතික ලේඛනාරක්ෂක අධිකාරිය.